# හරිත තේ පැන් සාදය

නිර්වර්ණ
උපේක්ෂා සේනානායක
COLOURLESS

මෙල්බර්න් නගරයේදී මා අත්දුටු මිශ්‍ර විවාහ වල සෞන්දර්යය පිළිබඳව තීරු ලිපි ගනනාවක් වුව ද ලිවිය හැක්කේ එතරම් ප්‍රීතිමත් පවුල් ජීවිත බොහොමයක් මේ කෙටි කාලය තුල මා දැක තිබෙන බැවිනි. මා මිත්‍ර අධිකාරී මහතා උක්ත කී ප්‍රීතිමත් ගොන්නට අයත් මා බොහෝ කලක පටන් හඳුනන මගේ හිතවතෙකි. ඔහුගේ ප්‍රිය බිරිඳ නගුමි ජපන් ජාතික කාන්තාවක වන්නීය. අප නිතර මුණ ගැහුණේ අපේ නිවසේදී වූ අතර නගුමි ශ්‍රී ලාංකික ආහාර වල රසයට බෙ-හෙවින් ප්‍රිය කළාය. වරක් ඔවුන්ගේ තට්ටු නිවාසයට පැමිණෙන්නැයි අපට ඇරයුම් කළ ඇය හරිත තේ පැන් සාදයක් අප වෙනුවෙන් සූදානම් කර තිබුණාය.

අධිකාරී මහතා විස්තර කළ පරිදි ජපන් ජාතිකයන් රාත්‍රී ආහාරය සවස හය පමණ විට නිමවා අනතුරුව ස්නානය කරති. ඔවුහු බොහෝ රෑ බෝ වන තුරු නිදි වරන්නේ ඉතාම අහම්බයෙනි. මේ නිසා හරිත තේ පානයට සවස තුන පමණ වන විට සහභාගී වීමට නියමිතව තිබුණි. වික්ටෝරියා ප්‍රාන්තයේ ජපන් ජාතිකයන් බහුලව වෙසෙන බවක් දක්නට නැත. නමුත් සිටින අතළොස්ස හරිත තේ පැන් සාදය උත්සවාකාරයෙන් සමරන බව අධිකාරී මහතා අපට විස්තර කළේය. ජපන් නවකථා වල මා කියවා ඇති පරිදි ජපන් ජාතිකයෝ තේ පානයට පෙර අවුළුපත් නැතහොත් රසකැවිලි වර්ග කිහිපයක් අනුභව කරති . උත්සවාකාරයෙන් සමරන හරිත තේ පැන් සාදයේදී ඔවුහු එම රසකැවිලි එවෙලේම සකස් කරති. ඊට අවශ්‍ය පිටි වර්ග සකස් කරගන්නෙද් ඔවුන්ගේ සාම්ප්‍රදායික මෙවලම් භාවිතා කරගනිමිනි.

අධිකාරී යුවළ අප සෙනෙහසින් පිළිගෙන ඔවුන්ගේ හුරුබුහුටි තට්ටු නිවාස ඒකකය තුළ ඇවිද නැරඹීමට ඉඩ සලසා දුන්හ. ජපන් සාම්ප්‍රදායික ඇඳ ඇතිරිළි, සිතුවම් සහ අපූරු සැරසිලි සහිත කුඩා නිවහන අතිශය පිළිවෙල සහ සරල තැනක් විය. අපේ දරුවෝ නගුමිගේ ජපන් චාරිත්‍රානුකූල මංගල ඇඳුම සහිත ඡායාරූපය දෙස පුදුම වී බලා සිටියහ. ඉතා උස් වූ හිස් වැසුමක් පැලැඳ සිටි ඇගේ පෙනුම සිත් අලවන සුළු විය. තේ මේසයට වාඩි වූ පසු ඇය



ඔවුන්ගේ රසකැවිලි පිළිබඳව යම් හැඳින්වීමක් කළාය. පැණිපොල් වලට සමාන නමුත් එපමණ තෙත් ගතියක් නොපෙන්වූ සහ පැණි රසින් අඩු "මංජු" නම් වූ කැවිළි වර්ගයක් අප වෙනුවෙන් ඇය පිළියෙල කර තිබුණාය. මුරුක්කු වලට බොහෝ දුරට සමාන "කලින්තේ " නම් වූ රසකැවිළි වර්ගයට කුඩාදරුවෝ මහත් සේ ඇලුම්කළ අතර ඔවුහු කඩිනමින් තසිමෙන් අඩක් හිස් කළහ. ඇපල් කේක් සහ තවත් විස්කෝතු වර්ගද ඇය අප වෙනුවෙන් සකස් කර තිබුණි.

රසකැවිලි කෑමෙන් පසු හරිත තේ සකස් කිරීම ඇරඹුණි. කුඩා සුප් බඳුනක හැඩය ගත් පිඟන් මැටියෙන් කළ බඳුනට හරිත තේ කුඩු සහ උණුවතුර යොදා කුඩා බුරුසුවක් වැනි මෙවලමකින් කලවම් කර සකස් කරන හරිත තේ ඉතා තද කොළ පැහැයක් ගත්තේය. තේ බඳුන ඇය අපට පිළිගැන්වූයේද අපූරු ක්‍රමයකටය. බඳුන අතට ගත් පසු ආචාර කර තේ පානය ආරම්භ කළ හැකිය. එය බැලූ බැල්මට කොළ කැඳ මෙන් කොළ පැහැයක් ගත්තද රසය ප්‍රණීත විය. මිහිරි සුවඳක්ද වහනය විය. සැබෑ හරිත තේ වල ගුණය මා කෙතෙක් අසා තිබුණද එහි නියම ගුණ සුවඳ දැනගත්තේ අධිකාරී නිවසේදීය. ජපන් ජාතිකයන්ගේ සෞඛ්‍ය සම්පන්න බවේ රහස ඔවුන්ගේ අපූරු ආහාර පාන සහ සුවිශේෂී ජීවන රටාව ම නොවන්නේද?










| MONTH | CUT OFF DATE | ESTIMATED DATE OF COLLECTION |
|---|---|---|
| APRIL | 16.04.2016 | 23.05.2016 |
| MAY | 21.05.2016 | 27.06.2016 |
| JUNE | 18.06.2016 | 25.07.2016 |
| JULY | 16.07.2016 | 22.08.2016 |
| AUGUST | 13.08.2016 | 19.09.2016 |
| SEPTEMBER | 10.09.2016 | 17.10.2016 |
| OCTOBER | 15.10.2016 | 21.11.2016 |
| NOVEMBER (1) | 05.11.2016 | 12.12.2016 |
| NOVEMBER (2) | 12.11.2016 | 19.12.2016 |
| NOVEMBER (3) | 19.11.2016 | 02.01.2016 |
| DECEMBER | 10.12.2016 | 23.01.2017 |